**අක්මීමන ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.176,640 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.3,296,419 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය ඇතිකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ගෙවූ රු.51,078 ක දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රධාන ලේකම්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු රු.10,921,058 ක්වූ මුද්දර ගාස්තු හා රු.1,811,500 ක්වූ උසාවි දඩ මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු.141,495,966 ක් හා රු.4,997,861 ක් ලෙස දැක්වීමෙන් පිළිවෙලින් රු.130,574,908 ක් හා රු.3,186,391 ක් වැඩියෙන් දැක්වුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි තොරතුරු ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.834,174 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.109,675,534 ක් වූ ලැබිය යුතු ශේෂ 04 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සොයා බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

#### (ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
| --- | --- | --- |
| 2016 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙන ලද රු.914,429 ක් වූ කර්මාන්ත ණයහිමියන් ද, 2008 වර්ෂයට පෙර සිට ඉදිරියට එන ලද රු.170,957 ක් වූ විවිධ ණයහිමි ශේෂය ද, 2012 වර්ෂයේ සිට ඉදිරියට එන ලද රු.310,010 ක් වූ වියදම් ණයහිමියෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සොයා බලා ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.82,073,833 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| | (i) රීති 33 | එක් එක් කාර්තුවක් අවසානයේ වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| | (ii) රීති 59 | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | රීති 145 | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් සකස් කර ලෙජරයේ දැක්වෙන ශේෂ සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (iv) | රීති 155 | ප්‍රධාන මුදල් පොත පී එස් 10 ආකෘතිය ප්‍රකාරව පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (v) | රීති 217 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් අංක පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාරව යාවත්කාලීන කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 396(ඇ) | ජංගම ගිණුම් දෙකක නිකුත් කල නමුත්, ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවා තිබූ රු.91,760 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 1645 | වාහන 05 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ චක්‍රලේඛය | විථි පහන් නඩත්තු කිරීම පිළිබඳව විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීමෙන් විථි පහන් නඩත්තු කිරීම සඳහා 2014 හා 2015 වර්ෂවලදී වැය වූ රු.165,000 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී ගිවිසුම් ගත වීමට කටයුතු කරමි. |
| (ඈ) | අංක 30/2016 දරන 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභා වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,887,137 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,082,256 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,225,000 | 4,177,539 | 2,516,333 | 10,543,923 | 5,205,000 | 4,176,393 | 3,143,902 | 8,882,717 |
| කුලී | 1,988,200 | 2,166,135 | 1,624,168 | 1,354,965 | 2,796,200 | 1,656,123 | 1,413,325 | 812,998 |
| බලපත්‍ර ගාස්තු | 1,621,000 | 1,559,055 | 1,238,972 | 320,983 | 2,876,000 | 1,114,097 | 1,114,097 | 900 |
| වෙනත් ආදායම් | 31,566,536 | 28,972,124 | 15,524,927 | 147,037,451 | 27,920,000 | 28,351,770 | 1,629,000 | 133,590,254 |
| | 40,400,736 | 36,874,853 | 20,904,400 | 159,257,322 | 38,797,200 | 35,298,383 | 7,300,324 | 143,286,869 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නංවාලීමට කටයුතු කල යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**(ඇ) කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී උපමාන පාදක ප්‍රතිපාදන යටතේ ලැබුණු එකතුව රු. 330,000 ක්වූ ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. | ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන අනුව ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු රු.9,989,848 ක් වූ ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. | ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 11 ක් පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමි. |

**(ආ) සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය, සේවය හැරගිය හා සේවය අත්හිටවූ සේවකයින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.144,156 ක්වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පුස්තකාල පොත් පරිහරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අපහරණය කල යුතු හා අලුත්වැඩියා කිරීමට නිර්දේශ කර තිබුණු පුස්තකාල පොත් 393 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව කටයුතු කල යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව කටයුතු කරමි. |

**3.4** **වත්කම් කළමනාකරණය**

**---------------------------------**

**නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| රු.6,221,373 ක් වටිනා කම්පැක්ටර් රථය වර්ෂයකට අධික කාලයක් අත් ට්‍රැක්ටරයක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී අපහරණය සිදු කිරීමට කටයුතු කරමි. |